අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. : ED/05/77/08/01/2024

ඔබේ යොමුව / உமது இல. / Your Ref. :

දිනය / திகதி / Date : 2024.08. 30

**චක්‍රලේඛ අංක : 05/2024 (II)**

සියළුම අතිරේක ලේකම්වරුන්
සියළුම ප්‍රධාන මූල්‍ය නිලධාරිවරුන්
අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්)
ලේකම් ජනරාල් ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව
සභාපති ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
සභාපති රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව
සියළුම ප්‍රධාන ගණකාධිකාරිවරුන්
සියළුම ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරුන්
ප්‍රධාන කොමසාරිස් (විද්‍යාපීඨ)
සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියළුම වැඩසටහන් ප්‍රධානීන්
සියළුම ව්‍යාපෘති ප්‍රධානීන්
සියළුම විෂය භාර අධ්‍යක්ෂවරුන්
සියළුම ගණකාධිකාරිවරුන්
සියළුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්
සියළුම විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්
සියළුම විදුහල්පතිවරුන්(ගුරු විදුහල්)
සියළුම කළමනාකරුවන් (ගුරු මධ්‍යස්ථාන)

**<u>මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව මුදල් පාලනය පිළිබඳ බලතල පැවරීම - 2024 වර්ෂය (සංශෝධනය II)</u>**

2024.02.21 වන දින ඉහත චක්‍රලේඛ අංක යටතේ අත්සන් කරන ලද **මුදල් රෙගුලාසි 135 ප්‍රකාරව මුදල් පාලනය පිළිබඳ බලතල පැවරීම - 2024 වර්ෂය** චක්‍රලේඛයෙහි සඳහන් **වගන්ති අංක 19.5, 21** සහ **උපලේඛනය - 01 යටතේ දක්වා ඇති ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යොමුව : 2.14.1, 9.3** හා 2024.05.07 වන දින සිදුකරන ලද සංශෝධනයෙහි දක්වා ඇති **වගන්ති අංක 10.1 ,10.2 , 21** හා පහත වැය විෂයයන් සංශෝධනය කරන බවත් කාරුණිකව දන්වා සිටිමි.

I. 126-1-01-0-1301
II. 126-1-01-0-2003
III. 126-1-02-0-1402
IV. 126-1-02-0-2003
V. 126-2-03-22-1302

## 10.1 ඒකාබද්ධ අරමුදලෙන් ඉටු කරන පුහුණු පාඨමාලා සහ වෙනත් වැඩසටහන්

ඒකාබද්ධ අරමුදලෙන් ඉටුකරනු ලබන පුහුණු පාඨමාලා සහ වෙනත් වැඩසටහන් සඳහා විස්තරාත්මක ඇස්තමේන්තු පිළියෙල කර පහත සීමාවන් යටතේ අදාල නිලධාරීන්ගෙන් අනුමැතිය ලබා ගත යුතු ය. බාහිර ආයතනවලින් සේවාවන් ලබා ගැනීම හෝ උපකරණ මිල දී ගන්නේ නම් 2006 රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කළ යුතු ය. මෙම කාර්යය සඳහා ඔබ අංශය/ආයතනය වෙත වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවන විට අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රධාන මූල්‍ය නිලධාරී වෙතින් සලසා ගැනීමෙන් පසු ඇස්තමේන්තු අනුමත කළ යුතුය. එමෙන්ම ප්‍රතිපාදන සලසා ගැනීමෙන් තොරව අනුමත කරන ඇස්තමේන්තු බලරහිත ඇස්තමේන්තු ලෙස සලකනු ලැබේ.

| | |
|---|---|
| අධ්‍යාපන අධ්‍යක්ෂ/ පලාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/ ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) / ප්‍රධාන ගණකාධිකාරි | රු. 100,000/- දක්වා |
| අංශභාර අතිරේක ලේකම්වරු/අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) අතිරේක ලේකම් (ප්‍රතිපත්ති සැලසුම්)/ ප්‍ර.මූ.නි. | රු. 1,000,000/- දක්වා |
| අතිරේක ලේකම් (පාලන) | - රු. 5,000,000/- දක්වා |
| අධ්‍යාපන ලේකම් | - රු. 5,000,000/- ට වැඩි |

## 10.2 විදේශාධාර/ විදේශ ණය මගින් මූල්‍ය සපයන ව්‍යාපෘති

විදේශාධාර මගින් කරනු ලබන වැඩසටහන්/ සම්මන්ත්‍රණ/ වැඩමුළු සඳහා වන ඇස්තමේන්තු වෙනුවෙන් දරන වියදම් සඳහා බලය දීමේ සීමාවන් :-

විදේශාධාර/ විදේශ ණය ව්‍යාපෘති යටතේ ඉදිරිපත් කරනු ලබන වැඩසටහන් සඳහා අයවැය ඇස්තමේන්තු පහත සීමාවන් යටතේ අනුමත කළ හැක. නමුත් එම ඇස්තමේන්තු තුළ ඇති බාහිර ආයතනවලින් ලබා ගන්නා සේවාවන් සඳහා මිල ගණන් කැඳවා රු.500,000/- දක්වා අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය ද රු.500,000/- ඉක්මවන සේවාවන් සඳහා ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය ද ලබා ගත යුතු ය. (උදා : හෝටල් තෝරා ගැනීමේ දී, භාණ්ඩ මිලදී ගැනීමේ දී)

| | |
|---|---|
| ව්‍යාපෘති අධ්‍යක්ෂ අධ්‍යාපන අධ්‍යක්ෂ/පලාත් අධ්‍යාපන අධ්‍යක්ෂ/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්/ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) / ප්‍රධාන ගණකාධිකාරි | -රු. 200,000/- දක්වා |
| අංශභාර අතිරේක ලේකම්වරු/අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) අතිරේක ලේකම්(ප්‍රතිපත්ති සැලසුම්)/ ප්‍ර.මූ.නි. | -රු.1,000,000/- දක්වා |
| අතිරේක ලේකම් (පාලන) | -රු. 5,000,000/- දක්වා |
| අධ්‍යාපන ලේකම් | -රු. 5,000,000/- ට වැඩි |

19.5 **නිෂ්පාදන ආයතනයේ දේශීය නියෝජිතයා ලවා අලුත්වැඩියාවන් කරවා ගන්නේ නම් පහත දැක්වෙන සීමාවන් අදාල වේ.**

| | |
|---|---|
| අ) සහකාර ලේකම් (ප්‍රවාහන). | - රු.100,000/- දක්වා |
| ආ) ජොෂ්ඨ සහකාර ලේකම් (ප්‍රවාහන). | - රු.150,000/- දක්වා |
| ඇ) අධ්‍යාපන ලේකම්/ අතිරේක ලේකම්(පාලන) / ප්‍රධාන මූල්‍ය නිලධාරි | - රු.500,000/- දක්වා |

රු.500,000/- ඉක්මවන අලුත්වැඩියාවන් සඳහා ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු ය.

21. **විධිමත් පරිදි බලය ලබා ඇති වැඩ, සැපයුම් හා සේවා වෙනුවෙන් වවුචර්පත්වල ගෙවීම අනුමත කිරීම පහත පරිදි වේ.**

| <u>අමාත්‍යාංශය</u> | <u>උපරිම සීමාව (රු.)</u> |
|---|---|
| සහකාර ලේකම්/ අධ්‍යක්ෂ/ ගණකාධිකාරි/ඉංජිනේරු (සිවිල්/ විදුලි/ යාන්ත්‍රික) / ප්රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන) | - රු.1,000,000/- දක්වා |
| ජො.ස.ලේකම්/ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්/ ප්‍රධාන ගණකාධිකාරි අධ්‍යක්ෂ (ඉංජිනේරු) | - රු. 5,000,000/- දක්වා |
| අතිරේක ලේකම්/ ප්‍රධාන මූල්‍ය නිලධාරි/ අධ්‍යක්ෂ ජනරාල් | -රු.100,000,000/-දක්වා |
| ලේකම් | - රු.100,000,000/-ට වැඩි |

තව ද කාර්යසාධන ඇපකරයක්, සේවා ගිවිසුමක් හෝ වෙනත් අවශ්‍ය ලියවිලි ද ලබාගෙන ගෙවීම් කළයුතු අවස්ථාවක ගෙවීම් කිරීමට ප්‍රථම එම ලියකියවිලි ලබා ගෙන ඇති බවට සනාථ කර ගත යුතු ය.

ජේ. එම්. තිලකා ජයසුන්දර,
ලේකම්

**පිටපත් :-**

1. විගණකාධිපති
2. රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්
3. අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
4. ප්‍රධාන අභ්‍යන්තර විගණක, අධ්‍යාපන අමාත්‍යාංශය

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යොමුව : 2.14.1

**01. කොන්ත්‍රාත්තු පිරිනැමීම නිර්දේශ/නිර්ණය කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුවල අධිකාරී සීමාවන්**

භාණ්ඩ, වැඩ සහ උපදේශක සේවා නොවන සේවා ප්‍රසම්පාදනය සඳහා තරඟකාරී ලංසු කැඳවීමේ පරිපාටිය (මාර්ගෝපදේශ 3.1, 3.2 හෝ 3.3), සෘජු කොන්ත්‍රාත් ක්‍රමය (මාර්ගෝපදේශ 3.5) හෝ නැවත ඇණවුම් කිරීමේ ක්‍රමය (මාර්ගෝපදේශ 3.6) අනුගමනය කිරීමේ දී:

1. ප්‍රසම්පාදන සිදු කිරීමේ බලය තීරණය කිරීමේදී එක් එක් ප්‍රසම්පාදනයේ මුළු පිරිවැය ඇස්තමේන්තුව සැලකිල්ලට ගත යුතුය.
2. කුලී සහ කල්බදු සිදු කරන අවස්ථා වලදී, සම්පූර්ණ කුලී හෝ කල්බදු කාල සීමාව සඳහා කොන්ත්‍රාත් වටිනාකම සැලකිල්ලට ගැනීම මඟින් ප්‍රසම්පාදන සිදු කිරීමේ බලය තීරණය කළ යුතුය.

| අධිකාරිය | ශ්‍රී ලංකා රජයේ අරමුදල්වලින් කරන කොන්ත්‍රාත්තු | විදේශ අරමුදල්වලින් කරන කොන්ත්‍රාත්තු |
|---|---|---|
| අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ස්ථාවර ප්‍රසම්පාදන කමිටුව (SCAPC)/ අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ප්‍රසම්පාදන කමිටුව (CAPC) | රු.මි. 750 ට වැඩි | රු.මි. 1500 ට වැඩි |
| අධ්‍යාපන අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව (MPC) | රු.මි. 750 දක්වා | රු.මි. 1500 දක්වා |
| පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (DPC)/ ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව (PPC) | රු.මි. 400 දක්වා | රු.මි. 800 දක්වා |
| කලාප අධ්‍යාපන කාර්යාල (RPC)/ විද්‍යාපීඨ ප්‍රසම්පාදන කමිටුව | රු.මි. 50 දක්වා | රු.මි. 100 දක්වා |
| අමාත්‍යාංශ සුළු ප්‍රසම්පාදන කමිටුව | රු.මි. 25 දක්වා | - |
| අමාත්‍යාංශ සුළු ප්‍රසම්පාදන කමිටුව (වාහන අළුත්වැඩියා) | රු.මි. 10 දක්වා | - |
| අමාත්‍යාංශ සුළු ප්‍රසම්පාදන කමිටුව (පිරිවෙන් කටයුතු) | රු.මි. 10 දක්වා | - |

**භාණ්ඩ, වැඩ සහ උපදේශක සේවා නොවන සේවා ප්‍රසම්පාදනය සඳහා වෙළඳපළ මිල සැසඳුම් ක්‍රමය අනුගමනය කිරීමේ දී (මාර්ගෝපදේශ 3.4) :**

1. සැපයුම් සහ සේවා කොන්ත්‍රාත් සඳහා,

   අ) ප්‍රමාණවත් පිළිගත් ගැනුම්කරුවන් ලැයිස්තුගත කර ඇත්නම්, ශ්‍රී ලංකා ටෙලිකොම් දේදුනු පිටු (SLT Rainbow Pages) වල ලැයිස්තුගත කර ඇති සැපයුම්කරුවන් මඟින්

   ආ) අදාළ වන්නේ නම්, ප්‍රසම්පාදන අස්ථිත්වයෙහි ලියාපදිංචි කර ඇති සැපයුම්කරුවන් මඟින්

   ඇ) රජයේ විද්‍යුත් ප්‍රසම්පාදන අවකාශය (**e-GP**) වන **www.promise.lk** වෙබ් අඩවියෙහි ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන් මඟින්, මිල ගණන් කැඳවීම කළ යුතුවේ.

2. ඉදිකිරීම් කොන්ත්‍රාත් සඳහා, ප්‍රජාව මූලික කරගත් සංවිධාන (Community Based Organizations-CBO) ඇතුළු ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ගෙන් මිල ගණන් කැඳවීම කළ යුතු වේ.

   ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූල වන පරිදි පිළිගත් ලිපි ලේඛන භාවිතා කළ යුතු අතර, අදාළ වන පරිදි, පෙර ඉදිරිපත් කරන ලද අවසන් දිනයට හා ප්‍රසිද්ධ ලංසු කැඳවීම මඟින් ලංසු කැඳවීම අවසන් කළ යුතුය.

| **ප්‍රසම්පාදන කමිටුව/අධිකාරිය** | **ප්‍රසම්පාදන මාර්ගෝපදේශ (3.4) වගන්තියට අනුව, අවම වශයෙන් මිල කැඳවීම් තුනකට (03) ආරාධනා කිරීමෙන්** | **අධිකාරි සීමාව (රු.මි.)** | |
|---|---|---|---|
| | | **ශ්‍රී ලංකා රජයේ අරමුදල්** | **විදේශ අරමුදල්** |
| අධ්‍යාපන අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව MPC | වැඩ | 40 දක්වා | 40 දක්වා |
| | භාණ්ඩ සහ උපදේශක සේවා නොවන සේවා | 25 දක්වා | 35 දක්වා |
| පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව/ ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව DPC/PPC | වැඩ, භාණ්ඩ සහ උපදේශක සේවා නොවන සේවා: | 20 දක්වා | 30 දක්වා |
| කලාප අධ්‍යාපන කාර්යාල / විද්‍යාපීඨ ප්‍රසම්පාදන කමිටුව RPC | වැඩ, භාණ්ඩ සහ උපදේශක සේවා නොවන සේවා | 06 දක්වා | 06 දක්වා |
| දෙ.ප්‍ර./ව්‍යා.අ./CAO | වැඩ | 02 දක්වා | |
| | භාණ්ඩ සහ උපදේශක සේවා නොවන සේවා | 01 දක්වා | |

**සුළු වටිනාකම් සහිත අළුත්වැඩියා වැඩ, භාණ්ඩ හා සේවා සෘජු මිලදී ගැනීම (මාර්ගෝපදේශ 3.5 හෝ 3.6) (ශ්‍රී ලංකා රජයේ අරමුදල් හෝ විදේශ අරමුදල් භාවිතා කරන)**

| අධිකාරිය | සම්පූර්ණ කළ යුතු කරුණු | අධිකාරී සීමාව |
|---|---|---|
| ප්‍ර.ග.නි./දෙ.ප්‍ර./ ව්‍යා.අ. | වැඩ:<br>• මාර්ගෝපදේශ 3.5 හෝ 3.6 හි සඳහන් විධිවිධාන සපුරාලන | රු.1,000,000/- දක්වා |
| | වැඩ:<br>• තරඟකාරි ලංසු කැඳවීම පිරිමැසුම්දායී නොවන විට.<br>• ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායී බව පිළිබඳව ප්‍ර.ග.නි./දෙ.ප්‍ර./ ව්‍යා.අ. සහතික විය යුතුය.<br>• මෙම අධිකාරය ප්‍ර.ග.නි./දෙ.ප්‍ර./ ව්‍යා.අ. ගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කළ යුතු අතර, වෙනත් පුද්ගලයෙකු වෙත නොපැවරිය යුතුය. | රු.500,000/- දක්වා |
| | **භාණ්ඩ සහ උපදේශක සේවා නොවන සේවා:**<br>• මාර්ගෝපදේශ 3.5 හෝ 3.6 හි සඳහන් විධිවිධාන සපුරාලන | රු.500,000/- දක්වා |
| ප්‍ර.ග.නි./දෙ.ප්‍ර./ ව්‍යා.අ. | **සෘජුවම වෙළඳපොළෙන් භාණ්ඩ සහ උපදේශක සේවා නොවන සේවා** ප්‍රසම්පාදනය:<br>• තරඟකාරි ලංසු කැඳවීම පිරිමැසුම්දායී නොවන විට.<br>• ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායී බව පිළිබඳව ප්‍ර.ග.නි./දෙ.ප්‍ර./ ව්‍යා.අ. සහතික විය යුතුය.<br>• මෙම අධිකාරය ප්‍ර.ග.නි./දෙ.ප්‍ර./ ව්‍යා.අ. ගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කළ යුතු අතර, වෙනත් පුද්ගලයෙකු වෙත නොපැවරිය යුතුය. | රු.200,000/- දක්වා |
| දෙ.ප්‍ර./ ව්‍යා.අ. | **මෝටර් රථ සහ වෙනත් උපකරණ අළුත්වැඩියාව:**<br>• තරඟකාරි ලංසු කැඳවීම පිරිමැසුම්දායී නොවන විට.<br>• ප්‍රසම්පාදනයේ පිරිමැසුම්දායී බව පිළිබඳව ප්‍ර.ග.නි./දෙ.ප්‍ර./ ව්‍යා.අ. සහතික විය යුතුය.<br>• මෙම අධිකාරය ප්‍ර.ග.නි./දෙ.ප්‍ර./ ව්‍යා.අ. ගේ පෞද්ගලික අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කළ යුතුය.<br>• රු.700,000/- ඉක්මවන අළුත්වැඩියාව සඳහා ප්‍ර.ග.නි. ගේ පෞද්ගලික අනුමැතිය ලබා ගත යුතුය. | රු.700,000/- දක්වා |
| දෙ.ප්‍ර. විසින් බලය පවරන ලද ප්‍රාදේශීය ප්‍රධානීන් හෝ අදාළ ඒකක/අංශ භාර කටයුතු කරන නිලධාරීන් | **එක් දිනක දී එක් කටයුත්තක් සඳහා රු.20,000/- නොඉක්මවන පරිදි සුළු වටිනාකම්වලින් යුත් උපකරණ ද ඇතුළු භාණ්ඩ හා සේවා මිළ දී ගැනීම.**<br>• එක් ලිත් මාසයක් තුළ සිදු කරන එවැනි මිළ දී ගැනීම්වල එකතුව රු.100,000/- නොඉක්මවිය යුතුය. | රු.20,000/- දක්වා |
| | මසකට රු.100,000/- නොඉක්මවන මෝටර් රථ වාහන අළුත්වැඩියා කිරීම. | රු.100,000/- දක්වා |

| අනුමත කිරීමේ අධිකාරිය | |
|---|---|
| කොන්ත්‍රාත්තුව පිරිනමනු ලැබීමට පෙර ප්‍රසම්පාදන කමිටු විසින් කර ඇති නිර්දේශ/නිර්ණයන් සඳහා පහත සඳහන් අධිකාරීන්ගේ (බලය පැවරීම සම්බන්ධයෙන් මු.රෙ.135 හි සඳහන් විධිවිධානයන්ට යටත්ව) අනුමැතිය ලබා ගත යුතුය. | |
| ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව | දෙපාර්තමේන්තු ප්‍රධානියා |
| ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුව | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා |
| දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව | |
| අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව | |
| අමාත්‍යාංශ සුළු ප්‍රසම්පාදන කමිටුව | අතිරේක ලේකම් (පාලන) |
| අමාත්‍ය මණ්ඩලය විසින් පත්කළ ප්‍රසම්පාදන කමිටුව | අමාත්‍ය මණ්ඩලය |
| අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු/දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු/ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටු අධිකාරී සීමාවන් තුළ පහළ වටිනාකම් සහිත ප්‍රසම්පාදන කටයුතු සඳහා සුළු කමිටුවක්/කමිටු පත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට හැකි ය. එම ප්‍රසම්පාදන කමිටු සඳහා අනුමත කිරීමේ අධිකාරිය ප්‍රධාන ගණන් දීමේ නිළධාරී විසින් සුදුසු අතිරේක ලේකම්වරයකු වෙත පැවරිය හැක. එවිට ප්‍රසම්පාදන කාර්ය සංග්‍රහයේ 2.7.4, 2.7.5 හා 2.7.6 යටතේ සඳහන් කමිටු සංයුතිය වෙනස් කිරීමට ද ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට හැකි ය. | |

| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යොමුව: 9.3 (සබැඳි) |
| --- |
| වාහන සහ උපකරණ අලුත්වැඩියා කිරීම |
| 9.3.1<br>අ) ප්‍රසම්පාදන අස්ථිත්වය (**Procuring Entity – PE)** විසින් කැඳවා තිබෙන මිල ගණන් සාධාරණ බවට සෑහීමකට පත් වන්නේ නම්, අදාළ අලුත්වැඩියා ව සඳහා වැය වන අලුත්වැඩියා පිරිවැය, මෝටර් වාහන වල භාවිතයේ පැවති මුළු කාලසීමාව හා ඒවායේ වර්තමාන තත්ත්වය සැලකිල්ලට ගනිමින්, මෝටර් වාහන හා වෙනත් උපකරණ වල අලුත්වැඩියා කටයුතු අදාළ නිෂ්පාදකයාගේ දේශීය පිළිගත් නියෝජිතයන් හරහා සිදු කළ යුතු වේ.<br>ආ) අංශ ප්‍රධානී විසින් ප්‍රසම්පාදන අත්පොතෙහි සඳහන් වන පරිදි බලය පැවරීම සිදු කළ යුතුය. කෙසේ වුවද රු.700,000.00ක පිරිවැය (ශ්‍රී ලංකා රුපියල් ලක්ෂ හතක්) ඉක්මවනු ලබන අලුත්වැඩියා කටයුතු සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතුය. |